# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2493/03 - 2026 ජුනි මස 15 වැනි සඳුදා - 2026.06.15**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 ජුනි මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි “**2026 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**” ලෙස හඳුන්වනු ලැබේ.

2. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2026 පෙබරවාරි 27 දිනැති අංක 26/0422/810/014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව වූ, 2026 මාර්තු 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි පනවනු ලැබේ.

3. කලින් කළට සංශෝධනය කරන ලද සහ අවසන්වරට 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/41 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි මගින් සංශෝධිත, 1979 අප්‍රේල් 27 දිනැති අංක 33/24 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 1979 අපනයන රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   **3.1** ඉහත අංක 3 දරන රෙගුලාසියේ සඳහන් අපනයන රෙගුලාසිවල **III** වන උපලේඛනයට, පහත විස්තරකර ඇති භාණ්ඩ සහ ඒවාට අදාළ සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | ***IV** තීරුව අපනයන පාලන බලපත්‍රය **(ECL)*** |
|---|---|---|---|---|---|
| **64** | **73.26** | | | **යකඩ හෝ වානේ වලින් කිමකළ අනෙකුත් භාණ්ඩ** | |
| | | 7326.90 | - | අනෙකුත්: | |
| | | 7326.90.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |
| **65** | **74.12** | | | **තඹ නළ සහ පයිප්ප වැද්දුම් (උදාහරණ වශයෙන්, සන්ධි, එල්බෝ මුට්ටු, විලි).** | |
| | | 7412.20 | - | තඹ ලෝහ මිශ්‍රණ වලින් වූ | **L** |
| | | | | | |
| **66** | **74.15** | | | **තඹවලින් කළ හිස සහිත වූ (ශීර්ෂ 83.05ට අයත් ඒවා හැර) තඹ හෝ යකඩ හෝ වානේ වලින් නිම වූ ඇණ, රබන් ඇණ, චිත්‍ර අඳින්නන්ගේ කටු, ස්ටේපල් ඇමුණුම් කටු සහ ඒ හා සමාන භාණ්ඩ; තඹ වලින් නිම වූ ඉස්කුරුප්පු, බෝල්ට් ඇණ, මුරිච්චි, ඉස්කුරුප්පු කොකු, රිවට්,කොටර් ඇණ, කොටර් කටු සිල්ලු (දුණු සිල්ලු ඇතුළු) සහ ඒ හා සමාන භාණ්ඩ** | |
| | | | - | පොටවල් නොකැපූ, අනෙකුත් භාණ්ඩ: | |
| | | 7415.29 | -- | අනෙකුත් | **L** |
| | | | - | පොට කැපූ අනෙකුත් භාණ්ඩ: | |
| | | 7415.33 | -- | ඉස්කුරුප්පු; ඇණ සහ මුරිච්චි : | |
| | | 7415.33.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |
| **67** | **76.10** | | | **ඇලුමිනියම් වලින් තැනූ (ශීර්ෂ 94.06 යටතේ ගැනෙන (ගලපා සැකසූ ගොඩනැගිලි හැර) නිර්මාණ සහ නිර්මාණ කොටස් (උදාහරණ වශයෙන්, පාලම් සහ බණ්ඩ, ටවර්, ලැටීඩ මාස්ට,පියසි පියසි රාමු, දොර සහ ජනෙල් සහ ඒවායේ රාමු සහ දොරවල් සඳහා උළුවහු,ගරාදි, කුලුණු සහ කණු) නිර්මාණ සඳහා පාවිච්චි කරනු ලබන ඇලුමිනියම් තැටි, දඬු,නොනිමි හැඩයන්, නළ සහ එවැනි දෑ; නිර්මාණ.** | |
| | | 7610.90 | - | අනෙකුත් | |
| | | 7610.90.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |
| **68** | **76.16** | | | **ඇලුමිනියම් වලින් තැනූ අනෙකුත් භාණ්ඩ** | |
| | | 7616.91 | -- | ඇලුමිනියම් කම්බිවලින් සැදි,රෙදි, ග්‍රිල් දැල්රෙදි සහ ආවරණ කම්බි: | |
| | | 7616.91.90 | --- | අනෙකුත් | **L** |
| | | 7616.99 | -- | අනෙකුත්: | |
| | | 7616.99.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | ***IV තීරුව අපනයන පාලන බලපත්‍රය (ECL)*** |
|---|---|---|---|---|---|
| **69** | **82.12** | | | දැලිපිහියා සහ දැලි පිහියා තල (තීරු වලින් යුක්ත වූ හෝ නොවූ දැලි පිහිතල බ්ලැන්ක් ඇතුළුව). | |
| | | 8212.10 | - | දැලි පිහියා : (රැවුල කපන රේසර්) : | |
| | | 8212.10.10 | --- | පාවිච්චි කිරීමෙන් පසු ඉවතලන රේසර් මුහුණත් (සම්පූර්ණ නොවූ රැවුල කපන රේසර්) | **L** |
| | | | | | |
| **70** | **83.02** | | | **ගෘහ භාණ්ඩ, දොර, තරප්පු පෙළ, ජනේල, ජනෙල් වැස්ම, රිය පෙට්ටි, සැදල උපකරණ, ට්‍රන්ක් පෙට්ටි, පෙට්ටගම්, මංජුසා සහ එවැනි දෑ සඳහා යෝග්‍ය වන සේ නීච ලෝහයෙන් සාදන ලද උපකරණ හා නැංවුම් ; නීච ලෝහයෙන් තනන ලද තොප්පි රාක්ක, තොප්පි කොකු, බ්‍රැකට්ස් සහ අනෙකුත් සවිකරණ; නීච ලෝහයෙන් සාදන ලද ස්වයංක්‍රීය දෙරවැසුම් උපකරණ.** | |
| | | | - | අනෙකුත් නැංවුම්, උපකරණ හා වූ සමාන ද්‍රව්‍ය: | |
| | | 8302.42 | -- | අනෙකුත් ගෘහ භාණ්ඩ සඳහා යෝග්‍ය | **L** |
| | | | | | |
| **71** | **83.06** | | | **නීච ලෝහයෙන් සාදන ලද විදුලියෙන් ක්‍රියා නොකරන සීනු ඝණ්ඨාර හා සමාන ද්‍රව්‍ය; නීච ලෝහයෙන් සාදන ලද කුඩා පිළිම හා අනෙකුත් සැරසිළි; නීච ලෝහයෙන් සාදන ලද ඡායාරූප පින්තූර හා ඒ හා සමාන රාමු ; නීච ලෝහයෙන් සාදන ලද කැඩපත්** | |
| | | 8306.10 | - | සීනු, ඝණ්ඨාර හා සමාන ද්‍රව්‍ය: | |
| | | 8306.10.10 | --- | බයිසිකල් සඳහා සීනු | **L** |
| | | 8306.10.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |
| **72** | **84.07** | | | **පුලිඟු ජ්වලන රෙසිප්‍රොකේටින් හෝ රොටරි අභ්‍යන්තර දහන පිස්ටන් එන්ජින්** | |
| | | 8407.10 | - | ගුවන් යානා එන්ජින් | **L** |
| | | | - | නාවික ධාවන එන්ජින්: | |
| | | 8407.21 | -- | අවුට්බෝඩ මෝටර්: | **L** |
| | | 8407.29 | -- | අනෙකුත් : | **L** |
| | | | - | 87 වන පරිච්ඡේදය යටතේ ගැනෙන වාහන ධාවන සඳහා පාවිච්චි කරනු ලබන වර්ගයකට අයත් රෙසිප්‍රොකේටින් පිස්ටන් එන්ජින් : | |
| | | 8407.31 | -- | සිලින්ඩර් ඝන ධාරිතාව ඝන සෙ. මීටර් 50 නොඉක්මවන්නා වූ: | |
| | | 8407.31.10 | --- | ත්‍රිරෝද රථ (ඔටෝ ට්‍රයිෂෝ) ධාවනය සඳහා භාවිත කරන වර්ගයකට අයත් ද්විත්ව පහර පෙට්‍රෝල් එන්ජින් | **L** |
| | | 8407.31.20 | --- | අනෙකුත්,පාවිච්චි කළ | **L** |
| | | 8407.31.90 | --- | අනෙකුත් | **L** |

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව අපනයන පාලන බලපත්‍රය (ECL)* |
|---|---|---|---|---|---|
| | | 8407.32 | -- | සිලින්ඩර් සහ ධාරිතාව ඝන සෙ.මීටර් 50 ඉක්මවන 250 නොඉක්මවන්නා වූ: | |
| | | 8407.32.10 | --- | ත්‍රිරෝද රථ (ඔටෝ ට්‍රයිෂෝ) ධාවනය සඳහා භාවිත කරන වර්ගයකට අයත් ද්විත්ව පහර පෙට්‍රෝල් එන්ජින් | L |
| | | 8407.32.20 | --- | අනෙකුත්, පාවිච්චි කළ | L |
| | | 8407.32.90 | --- | අනෙකුත් | L |
| | | 8407.33 | -- | සිලින්ඩර් ඝන ධාරිතාව ඝන සෙ.මීටර් 250 ඉක්මවන නමුත් ධාරිතාව 1,000 නොඉක්මවන්නා වූ: | |
| | | 8407.33.10 | --- | ත්‍රිරෝද රථ (ඔටෝ ට්‍රයිෂෝ) ධාවනය සඳහා භාවිත කරන වර්ගයකට අයත් ද්විත්ව පහර පෙට්‍රෝල් එන්ජින් | L |
| | | 8407.33.20 | --- | අනෙකුත් , පාවිච්චි කළ | L |
| | | 8407.33.90 | --- | අනෙකුත් | L |
| | | 8407.34 | -- | සිලින්ඩර් ඝන ධාරිත්ව ඝන සෙ.මීටර් 1,000 ඉක්මවන්නා වූ: | |
| | | 8407.34.10 | --- | අවුරුදු 10 කට වඩා පැරණි | L |
| | | 8407.34.90 | --- | අනෙකුත් | L |
| | | 8407.90 | - | අනෙකුත් එන්ජින් : | |
| | | 8407.90.10 | --- | අවුරුදු 10 කට වඩා පැරණි | L |
| | | 8407.90.90 | --- | අනෙකුත් | L |
| | | | | | |
| **73** | **84.24** | | | **(අතින් ක්‍රියා කරවන හෝ නොකරවන) ද්‍රව හෝ කුඩු විදීම, විසිරුවා හැරීම හෝ ඉසීම සඳහා යාන්ත්‍රික උපකරණ ; පුරවන ලද හෝ නොලද ගිණි නිවනයන් ; ඉසින තුවක්කු හෝ එවැනි උපකරණ; හුමාල හෝ වැලි ප්‍රස්තෝටක යන්ත්‍ර සහ එවැනි පිහිරි විදින යන්ත්‍ර.** | |
| | | 8424.10 | - | පුරවන ලද හෝ නොලද ගිණි නිවනයන් | L |
| | | 8424.20 | - | ඉසින තුවක්කු හෝ එවැනි උපකරණ | L |
| | | 8424.30 | - | හුමාල හෝ වැලි ප්‍රස්ෆෝටක යන්ත්‍ර සහ එවැනි පිහිරි විදින යන්ත්‍ර | L |
| | | | - | කෘෂිකාර්මික හෝ උද්‍යාන විද්‍යාස්ප්‍රේ යන්ත්‍ර: | |
| | | 8424.41 | -- | පහසුවෙන් ගෙන යා හැකි ස්ප්‍රේ යන්ත්‍ර | L |
| | | 8424.49 | -- | අනෙකුත් | L |
| | | | - | අනෙකුත් උපකරණ : | |
| | | 8424.82 | -- | කෘෂිකාර්මික හෝ උද්‍යාන විද්‍යා | L |
| | | 8424.89 | -- | අනෙකුත් | L |
| | | 8424.90 | - | කොටස් | L |
| | | | | | |

| | I තීරුව ශීර්ෂ අංකය | II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව විස්තරය | IV තීරුව අපනයන පාලන බලපත්‍රය (ECL) |
|---|---|---|---|---|---|
| **74** | **84.29** | | | **ස්වයංධාවක බුල්ඩෝසර් හා ඇංගල්ඩෝසර්, ග්‍රේඩර්, මට්ටම් කිරීමේ යන්ත්‍ර, සූරන යන්ත්‍ර, යාන්ත්‍රික සවල්, කැණීමේ යන්ත්‍ර, සවල් ලෝඩර්, කෙටීමේ යන්ත්‍ර සහ මාර්ග තැලීමේ යන්ත්‍ර.** | |
| | | | - | බුල්ඩෝසර් සහ ඇංගල්ඩෝසර් : | |
| | | 8429.11 | -- | ධාවන පථ ඇතිරීමේ | **L** |
| | | 8429.19 | -- | අනෙකුත් | **L** |
| | | 8429.20 | - | ග්‍රේඩර් සහ මට්ටම් කිරීමේ යන්ත්‍ර | **L** |
| | | 8429.30 | - | සූරන යන්ත්‍ර | **L** |
| | | 8429.40 | - | කෙටීමේ යන්ත්‍ර හා මාර්ග තැලීමේ යන්ත්‍ර | **L** |
| | | | - | යාන්ත්‍රික සවල්, කැනීමේ යන්ත්‍ර සහ සවල් ලෝඩර්: | |
| | | 8429.51 | -- | ඉදිරි- කෙළවර සවල් ලෝඩර් | **L** |
| | | 8429.52 | -- | 360º ක භ්‍රමණ සුපිරි ආකෘතියක් සහිත යන්ත්‍ර | **L** |
| | | 8429.59 | -- | අනෙකුත් | **L** |
| | | | | | |
| **75** | **84.32** | | | **පස් සැකසීම හෝ වගා කිරීම සඳහා කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාතත්මක හෝ වන විද්‍යාත්මක යන්ත්‍ර සූත්‍ර ; තණ පිටි හෝ ක්‍රීඩා පිට්ටනි රෝලර්.** | |
| | | 8432.10 | - | නඟුල් | **L** |
| | | | - | දැති පෝරු, ස්කැරිෆයර, වගාකරණ උපකරණ, වල් පැලැටි ගලවන උපකරණ, පස් බුරුල් කරන උපකරණ: | |
| | | 8432.21 | -- | කවාකාර දැති පෝරු | **L** |
| | | 8432.29 | -- | අනෙකුත් | **L** |
| | | | - | බීජ ඉසින යන්ත්‍ර, පැල සිටවීමේ යන්ත්‍ර සහ පැල: | |
| | | 8432.31 | -- | ඍජුව බිම් සකස් නොකරන බීජ ඉසින යන්ත්‍ර, පැල සිටවීමේ යන්ත්‍ර සහ පැල | **L** |
| | | 8432.39 | -- | අනෙකුත් | **L** |
| | | | - | පොහොර ඉසින යන්ත්‍ර සහ රසායනික පොහොර බෙදා හැරීමේ යන්ත්‍ර: | |
| | | 8432.41 | -- | පොහොර ඉසින යන්ත්‍ර | **L** |
| | | 8432.42 | -- | රසායනික පොහොර බෙදාහැරීමේ යන්ත්‍ර | **L** |
| | | 8432.80 | - | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර: | |
| | | 8432.80.10 | --- | තණ පිටි හෝ ක්‍රීඩා පිට්ටනි රෝලර් | **L** |
| | | 8432.80.90 | --- | අනෙකුත් | **L** |
| | | 8432.90 | - | කොටස් : | |
| | | 8432.90.10 | --- | තණ පිටි හෝ ක්‍රීඩා පිට්ටනි රෝලර් සඳහා | **L** |

| | *I තීරුව ශීර්ෂ අංකය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | ***IV තීරුව අපනයන පාලන බලපත්‍රය (ECL)*** |
|---|---|---|---|---|---|
| | | 8432.90.90 | --- | අනෙකුත් | **L** |
| | | | | | |
| **76** | **84.54** | | | **ලෝහ කර්මාන්තයේ සහ ලෝහ වාත්තු පට්ටලවල පාවිච්චි කරන වර්ගයේ, පරිවර්තක, හැඳි, ලෝහ කුට්ටි අච්චු සහ වාත්තු කරන යන්ත්‍ර.** | |
| | | 8454.20 | - | ලෝහ කුට්ටි අච්චු සහ හැඳි | **L** |

4. සංශෝධිත පරිදි වූ 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ දක්වා ඇති ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු, පහත සඳහන් භාණ්ඩ කාණ්ඩ සඳහා ගෙවිය යුතු අපනයන පාලන බලපත්‍ර ගාස්තුව එම ගැසට් පත්‍රයේ **II වන උපලේඛනය**ට ඇතුළත් කිරීම මගින් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *අනුක්‍රමික අංකය* | *අයිතමය* | *අපනයන බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| 5 | ලෝහ ආශ්‍රිත නිෂ්පාදන | අවම ගාස්තුව රු. 5,000/- ක් වන අතර මෙට්‍රික් ටොන් 1ක් සඳහා රු. 125/- බැගින් වේ. |

5. මෙම රෙගුලාසි 2026 ජුනි 15 දින සිට බලාත්මක වේ.

EOG 06 - 0245

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.